# මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ගොවිපල

**ගොවිතැන් කටයුතු ගැන දූන් සෑම කෙනෙක්ම ලොකු උනන්දුවක් දක්වන බව හොඳට පැහැදිලි කාරණයක්. ආණ්ඩුවත්, නොයෙකුත් පුද්ගලික සමිති සමාගම් ආදියත් ඒවාට පුළුවන් සෑම උදව්වක්ම දෙනව, රටේ ජනතාවට ඕනෑ කරන ආහාර බෝග ආදිය මේ රටේම වගා කරන්න. මේ කටයුත්ත එතරම් ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. ඒ වගේම ඒ සඳහා හැම කෙනෙකුගේම උදව්වත්, සහයෝගයත් ලැබෙන්න ඕනෑ. ආණ්ඩුව මේ සම්බන්ධයෙන් ලොකු බලාපොරොත්තුවක් ඇති කරගෙන ඉන්නෙ තරුණ අය කෙරෙහිය. ගොවිතැන් ගැන කලින් තිබුනු ආකල්පයත් දූන් හුඟක් දුරට වෙනස් වෙලා. ලොකු ආදායමක් ලබන්න පුළුවන් ජීවන මාර්ගයක් හැටියට ගොවිතැන පිළිගන්න අය දූන් එන්න එන්නම වැඩි වෙනව.**

**දිවයින පුරා පිහිටුවා තිබෙන පාසැල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවොත් මෑතක සිට ගොවිතැන ගැන සැළකිල්ලක් දක්වනව. බොහෝවිට ශ්‍රමදාන ආදිය මගින් වල් නෙලීමේ ව්‍යාපාර, ඇළ දෙළ එළි පෙහෙළි කිරීමේ කටයුතු ආදියට ඔවුන් සහභාගි වෙනව විතරක් නොවෙයි, හුඟක් පාසැල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ගොවිපලවල් ආරම්භ කරල ඒවා හුඟක් සාර්ථක විදියට කරගෙන යනව.**

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ගොවිපල හුඟක් සාර්ථක ගොවිපලක් හැටියට හඳුන්වා දෙන්න පුළුවනි. මේ ගොවිපල පවත්වාගෙන යන්නෙ විද්‍යාලයේ ගුරු මණ්ඩලයේත්, ශිෂ්‍යයින්ගෙන් බලවත් උනන්දුවත් සහයෝගයත් ඇතිවයි. විද්‍යාලයේ ගුරු මණ්ඩලයේ **ඩබ්ලිව්. සින්නතම්බි** මහතා මේ ගොවිපල භාර කළමනාකරු හැටියට කටයුතු කරනව. ඔහු ඇත්ත වශයෙන්ම, මේ ගොවිපලේ වැඩ සාර්ථක කර ගන්න දරන උත්සාහය කාගේත් ප්‍රශංසාවට ලක්විය යුතුයි. සින්නතම්බි මහතා පිට රට විශ්ව විද්‍යාලවල ඉහළ විභාගවලින් සමත්වෙලා උපාධි ලබාපු කෙනෙක් වුවත්, මුළු දවස පුරාම ගොවිපලේ කටයුතු කරන්නේ, කිසිම වෙහෙස මහන්සියක් නැතුවයි. ගොවිපලේ තියෙන ඕනෑම වැඩක් කිරීම, කිසිම මදිකමක් හැටියට ඔහු සලකන්නෙ නැහැ. ගවගාල සෝදන්න හරි, නැත්නම් ඌරු කොටුව පිරිසිදු කරන්න හරි, කිසිම පැකිළීමක් නැතිව ඉදිරිපත් වන සින්නතම්බි මහතා ශ්‍රමයේ අභිමානය ගැන කාට වුනත් හොඳ ආදර්ශයක්. තම වයස ගැනවත් තැකිමක් නැතිව දිවා රෑ නොබලා ගොවිපලේ වැඩ කටයුතු කරන සින්නතම්බි මහතා ආඩම්බරයෙන් යුතුව කියා හිටියේ ගොවිපල භාරව අත පය වෙහෙසල වැඩ කරන්න පටන් ගත්තට පස්සෙ මෑත කාලෙකදී හිසේ ඇම්මක් තරම්වත් අසනීපයක් තමාට නොවැළඳුන බවයි. ගොවිපලෙහි ඔහුගේ සටන් පාඨය වී ඇත්තේ ''අපට ඕනෑ කරන ආහාර දින 110 ක් ඇතුළත අපිම වවා ගනිමු'' යන්නයි. මහනුවර ත්‍රිත්ව විද්‍යාලීයිය ගොවිපලේ මෙතෙක් ලබා ඇති දියුණුවට සින්නතම්බි මහතාගෙන් ඉටු වන සේවය සුළු පටු නොවෙයි. සින්නතම්බි මහතා මේ ගොවිපලේ ඉතිහාසය ගැන කරුණු සඳහන් කළා.

ත්‍රිත්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ට කය වෙහෙසා ගොවිතැන් කිරීම ගැන පළපුරුද්දක් ලබා දෙන්නටත්, ගොවි ජීවිතයකට ඕනෑ කරන අත්දැකීම් ඔවුනට ලබා දී, පොත පතින් ලබන දැනුමට ප්‍රායෝගික දැනුමක් එකතු කිරීමත් අරමුණු කරගෙන ගොවිපලක් ඇති කිරීමේ අදහස ඉදිරිපත් වුනෝ මීට බොහොම



**''අපට ඕනෑ කරන ආහාර දින 110 ක් ඇතුළත අපිම වවා ගනිමු'' යනුවෙන් ප්‍රකාශ කරන, ත්‍රිත්ව විද්‍යාලීය ගොවිපල භාර කළමනාකරු හැටියට වැඩ කරන ඩබ්ලිව්. සින්නතම්බි මහතා.**

කාලයකට ඉහතදීයි. 1952 දී පමණ ත්‍රිත්ව විද්‍යාලය බදු ඉඩමක ගොවිපල ආරම්භ කරගෙන ගියත් 1965 දී ඉඩම් හිමියාගෙ ඉල්ලීමකට අනුව ඒ ඉඩම ආපසු බාර දෙන්න සිදු උනා. ඉන් පස්සේ ලොකු ප්‍රශ්න යකට මුහුණ දෙන්න උනේ ගොවිපලට ඕනෑ කරන ඉඩමක් හොයා ගන්න එකයි. පල් ලෙකැලේ වත්ත ආණ්ඩුවට අරගන්න ඉස්සරවෙලා අක්කර 50 ක් විතර ත්‍රිත්ව විද්‍යාලයීය ගොවිපල සඳහා මිලයට ගන්න පුළුවන් වුනා. ගුරු මණ්ඩලයේ පාරිතෝෂික අරමුදලින් මේ කාර්යයට සෑහෙන ආධාරයක් ලබා ගන්න පුළුවන් වුන බව සින්නතම්බි මහතා කියා සිටිය.

ගොවිපලකට ඕනෑ කරන ගොඩනැගිලි ආදිය ඉදි කිරීම ඊළඟට තිබුන භාර දූර වැඩක්. ඒ සඳහා ඕනෑ කරන ගඩොල්, ලී, වාගේ දේවල් සපයා ගැනීමේදීත් ගොවිපල සඳහා මිලයට ගත්ත ඉඩමෙන්ම අමු ද්‍රව්‍ය හොයා ගන්න අදහස් කළා. සින්නතම්බි මහතා කිව්ව හැටියට ගොවිපලේ දැනට තියන ගව ගාල්, ගබඩා කාමර, ඌරු කොටු වාගෙ ඔක්කොම ගොඩනැගිලිවලට ඕනෑ කරන සම්පූර්ණ ගඩොල් ප්‍රමාණය පිළියෙල කර ගත්තෙ ගොවිපලේ ඉඩමෙන්මයි. ඒ වැඩ කරන්න ත්‍රිත්ව විද්‍යාලයේ ශිෂ්‍යයො හුඟක් මහන්සි වෙලා තියනවා.

දැන් ගොවිපලේ හරක් 110 ක් විතර ඉන්න ගව ගාලකුත්, ඌරෝ 250 ක් විතර ඉන්න ඌරු කොටුවකුත් තියනව. දවසකට කිරි පයින්ට් 300 ක් විතර ලබා ගන්න බව සින්නතම්බි මහතා කිව්ව. මේ ගව ගාල, ඌරු කොටුව ආදිය පිරිසිදු කරන්න යොද වන්නෙත් ත්‍රිත්ව විද්‍යාලයෙ ශිෂ්‍යයින්ව මයි.

දැනට අක්කර පනහක් විතර ඇති මේ ගොවිපලේ අක්කර දහයක් විතර හුඟාක් දුරට නොයෙකුත් දේවල් වවල තියනව. ඒ වගේම හොඳින් පල දරන පොල් ගස් 750ක් විතර ගොවිපල වත්තේ තියනව. වී, බඩ ඉරිඟු, බතල, ඉදල් ඉරිඟු ආදිය වවල තියෙන්නෙ හුඟක් ක්‍රමානුකූල අලුත්ම විදිවලට අනුවයි. මේ බෝග ජාති වවනකොට බිම එළි පෙහෙළි කිරීම, පස පිළියෙල කිරීම, පැල ඉන්දවීම වාගෙ හැම වැඩක්ම ත්‍රිත්ව විද්‍යාලයෙ ශිෂ්‍යයෝ කරන්නේ සින්න තම්බි මහතාගෙන් ලැබෙන උපදෙස්වල හැටි යටයි. මෙහෙම පිළිවෙලකට වගා කටයුතු කරන හින්ද හැම බෝග ජාතියකින්ම වාගෙ ලොකු අස්වැන්නක් ලබා ගන්න පුළුවන් වෙලා තියනව.

ත්‍රිත්ව විද්‍යාලයීය ගොවිපලේ වවල තියන ''සෙන්ටිනියල්'' කියන බතල වර්ගය හුඟක සරු අස්වැන්නක් ලබා ගන්න පුළුවන් අල වර්ගයක්. සමහර වෙලාවට එක බතල අලයක් රාත්තල් දෙකක් නැත්නම් තුනක් විතර බර තියන තරම් ලොකු අල මේ ගොවිපලේදී දකින්න ලැබුන. ඉදල් ඉරිඟු වගාවත් හුඟක් සරුවට කරල තියෙන්නෙ මෙම ගොවිපලෙයි. අක්කර දෙකක් ඉදල් ඉරිඟු වගා කරල ශ්‍රී ලංකාවෙ වාර්තාගත ලොකුම අස්වැන්න ලැබුනෙ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙ ගොවිපලෙනුයි.

මෙම ගොවිපලේ දකින්න තියන එක විශේෂ ලක්ෂණයක් තමයි බොහෝ විට නොයෙක් වතාවලදී අපතේ දමන දේවල් වලින් මොන විදියකට හරි ප්‍රයෝජනයක් ගැනීම. ගවගාල්, ඌරු කොටු ආදිය හෝදන වතුර නිකම්ම එක තැනකට රොක් කරල අපතේ යන්න සලස්වල නැහැ. ඒ වතුර කානු දිගේ එක එක බෝග ජාති වවල තියන තැන්වලට ගලාගන යන්න පුළුවන් හැටියට පිළියෙල කරල තියෙනව. ඒවායින් වගාවලට හොඳ පෝර රසයක් ලැබෙනව. ඉදල් ඉරිඟු අස්වැන්න රැස් කර ගත්තට පස්සේ, කොළ තියන ගහ කපාගෙන ඇවිත් ඌරන්ට කන්න දෙනව. ඌරො කාල ඉතිරි වෙන හරිය ඌරු කොටුව පිරිසිදු කළාට පස්සෙ කොම්පෝස්ට් පෝර හදන වලවල්වලට දමනව. මේ විදියට හැම දෙයකින්ම වාගෙ ප්‍රයෝජනයක් ගන්න උත්සාහ කරන එක මේ ගොවිපලේ හොඳ ලක්ෂණයක්.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ගොවිපලේ හතු වගාවත් හුඟක් සරුවට කරගෙන යනව. වෙනම හදල තියන මඩුවක් ඇතුලෙ මැස්සක් උඩ පිදුරු තට්ටු පිළියෙළ කරල ඒ පිදුරු තට්ටු උඩ හතු වවනව. පළමුවෙන්ම ලබා ගත් හතු තොගය කොළඹ තියන ජාත්‍යන්තර හෝටලයක ප්‍රයෝජනයට මිලදී ගත්ත බව සින්නතම්බි මහතා පැවසුවා. හතු වවන්න එතරම් වියදමක් යන්නේත් නැහැ. ඒ වගේම තියනව නම් ඕනෑ තරම් ප්‍රමාණයක් විකුණන්නත් පුළුවනි. සින්නතම්බි මහතා අදහස් කරනව ඒ ගොවිපලේ හතු වගාව තවත් හුඟක් දියුණු කරන්න.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ගොවිපල නොයෙක් විදේශ රටවල්වල තානාපතිවරුන් ගේත්, පිට රට වලින් මේ රට බලන්නට එන අයගේත් ලොකු ප්‍රශංසාවට ලක් වුන ගොවිපලක්. ඒ වගේම පිට රට සමිති සමාගම් වලින් නොයෙකුත් ආධාරත් මේ ගොවිපලට ලැබිල තියනව. මේ ළඟදී ඕස්ට්‍රේලියාවේ ඉඳල ලංකාවට ආපු එක පුවත්පත් කලාවේදියෙක් මේ ගොවිපල ගැන හුඟක් පැහැදිලා, ලංකාවේ ගුවන් විදුලියෙනුත් කථාවක් කරල ලොකු ප්‍රශංසාවක් කළා.

සින්නතම්බි මහතා කියන හැටියට ගොවිපලෙන් දැන් සැහෙන ආදයමක් ලැබෙනවා. ඒ ආදයම ගොවිපල තවත් දියුණු කරන්න යොදවනව. නොයෙක් වතාවල ගොවිතැන තමන්ගෙ ජීවන මාර්ගය හැටියට තෝරා ගන්න අදහස් කරන අය මේ ගොවිපලේ නතර වෙලා ත්‍රිත්ව විද්‍යාලයේ ශිෂ්‍යයොත් එක්ක එකට වැඩ කරල මූලික පුහුණුවක් ලබා ගන්නව. අක්කර 50 ක විතර ගොවිපලක් වුනහම සැහෙන වැඩ කොටසක් දිනපතාම කරන්න සිද්ද වෙනව. එක එක දිනයට, එක පංතියකින් ශිෂ්‍යයෝ 50 ක් විතර ගොවිපලට ඇවිත් උදය වරුවේ ගොවිපලේ වැඩ කටයුතු කර දෙන බව සින්නතම්බි මහතා කියා හිටිය. ත්‍රිත්ව විද්‍යාලය වැනි ප්‍රසිද්ධ විද්‍යාලයක් මේ විදියට ගොවිතැන් කටයුතුවලට මුල් තැනක් දීල වැඩ කිරීම අනාගතය ගැන හොඳ ශුභ ලකුණක් හැටියට කියන්න පුළුවනි. ශ්‍රී ලංකාවේ ගොවිතැන් කටයුතු වලදී පාසැල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලොකු මෙහෙයක් ඉටු කරන්න පුළුවනි.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයට ආඩම්බර වෙන්න පුළුවන් හැටියට මේ ගොවිපලේ වැඩ කටයුතු ටික කර ගන්න ඒ විද්‍යාලයේ විද්‍යාලයාධිපති තුමා ප්‍රධාන ගුරු මණ්ඩලයත් ශිෂ්‍යයිනුත් හැම වෙලාවකම සම්පූර්ණ සහයෝගය දක්වන බව සින්නතම්බි මහතා කියා සිටිය. ඔහු කීවේ, මෙච්චර ලොකුවට නැති උනත්, අක්කර එකක් හරි දෙකක් හරි ඉඩ තියන ප්‍රමාණයකට සෑම පාසැලක්ම මොන විදියේ හරි වගා කටයුත්තක් කරන්න උත්සාහ කළොත් අපේ ආහාර ප්‍රශ්නය විසඳා ගන්න එය ලොකු උදව්වක් වෙන බවයි. ඇත්ත වශයෙන්ම, ''අපේ ආහාරය දින 110 කින් අපිම නිපදවා ගනිමු'' කියන සටන් පාඨය අනුව කටයුතු කරන්න පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ උනන්දුවක් දක්වනව නම්, වගා සටන සම්පූර්ණයෙන්ම සාර්ථක කර ගැනීමට එය හොඳම රුකුලක් බවට කිසිම සැකයක් නැහැ.